**සීමා සහිත ලංකා පොහොර සමාගම- 2020/ 2021**

---------------------------------------------------------

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

සීමාසහිත ලංකා පොහොර සමාගමේ ("සමාගම") 2021 මාර්තු 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය,හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2021 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, සීමා සහිත ලංකා පොහොර සමාගමේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2021 මාර්තු 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, සමාගම අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය සමාගම ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා සමාගමේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.
සමාගමේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, සමාගමේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාචෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් ,චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද ,අවස්ථාචෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල ගිණුම් උචිතභාවය, කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් සමාගම අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.
හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කල සමාගමේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ සමාගමේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, සමාගම ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතීරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.5.1 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- | --- |
| (අ) | ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 02 ප්‍රකාරව වර්ෂයේ අවසන් තොගය භෞතිකව සත්‍යාපනය කර පිරිවැය හා ශුද්ධ උපලබ්ධි අගය යන දෙකෙන් අඩු අගයට ගිණුම්ගත කළයුතුය. ඒ අනුව බාහිර විගණකවරුන්ගේ සහභාගිත්වයෙන් 2021 ඔක්තෝම්බර් මාසයේදී භෞතික තොග සත්‍යාපනයක් සිදු කිරීමට කටයුතු කරන ලද නමුත් තොග ආගණනයන් සිදු කළ හැකි වන පරිදි තොග අසුරා නොතිබීම හේතුවෙන් තොගය භෞතිකව සත්‍යාපනය කළ නොහැකි විය.කෙසේ නමුත් තොග වාර්තා අනුව අවසාන තොගය රු.446,784,423 කට අගය කර අවසන් ගිණුම් තුළ දක්වා ඇති අතර එහි නිරවද්‍යතාවය පිළිබඳව විගණනයේදී සෑහීමකට පත්විය නොහැකි විය. | යල හා මහ කන්න වලදී වරායෙන් ලැබෙන තොග ප්‍රමාණයන් ක්ෂණිකව නිෂ්කාශන කටයුතු සිදු කළ යුතුව ඇත. එසේ ක්ෂණිකව නිෂ්කාශන කටයුතු සිදු නොකළ විට අප ආයතනයට කඩිනම් නිෂ්කාශන ආදායම් වශයෙන් ඩොලර් වලින් ලැබෙන මුදල අහිමිව යයි. එම හේතුවෙන් නෞකාවලින් ලැබෙන පොහොර තොග ඉතා කඩිනමින් අප සතු සීමිත ගබඩා පහසුකම් වල ගබඩා කළ යුතු වේ. | ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 02 ප්‍රකාරව අවසන් තොගය භෞතික සත්‍යාපනය කළ යුතුය. |
| (ආ) | සමාගම විසින් රු.6,000,000 ක් වූ මෙට්‍රික් ටොන් 122.73 ක පොහොර තොග ඌනතාවයක් අනාවරණය කරගෙන ඇති බව අංක 2.8.6 (h) දරන ගිණුම්කරණ සටහනෙහි දක්වා තිබුණි.එහෙත් එම පොහොර වර්ග මොනවාද, එහි වටිනාකම ගණනය කළ පදනම කුමක්ද යන්න පැහැදිලිකර නොතිබුණු අතර තොග ඌනතාවය පිරිවැයට ගළපා නොතිබීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ ලාභය රු.6,000,000 කින් අඩුවෙන් දක්වා තිබුණි. | ඉදිරි ගිණුම් වර්ෂය තුළදී ගැලපීම් කිරීමට කටයුතු කරනු ලැබේ. | පරීක්ෂණයක් සිදුකර අලාභය අයකර ගැනීමටත් පොහොර තොග ඌනතාවය පිරිවැයට ගැලපීමටත් කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | එක් එක් දිනට අදාළව ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ප්‍රකාශයට පත්කරනු ලබන විදේශ විනිමය හුවමාරු අනුපාතික වෙනුවට වෙනස් අනුපාතිකයන් මත විදේශ විනිමය හුවමාරු ලාභ අලාභ ගණනය කිරීම හේතුවෙන් ගිණුම්ගත වී ඇති විදේශ විනිමය හුවමාරු අලාභය රු.2,845,381 කින් අධිගණනය වී තිබුණි. | ඉදිරි ගිණුම් වර්ෂයේදී නිවැරදි කරනු ලැබේ. | ශ්‍රී ලංකා මහ බැංකුව විසින් දිනපතා ප්‍රකාශයට පත් කරනු ලබන විදේශ විනිමය හුවමාරු අනුපාතිකය මත විදේශ විනිමය හුවමාරු ලාභ අලාභ ගණනය කළ යුතුය. |
| (ඈ) | මාතලේ දිස්ත්‍රික්කය තුළ ලක්පොහොර ගබඩාව ස්ථාපිත කර ඇති වාරියපොල වත්ත නැමැති පර්චස් 29.93 ක් වපසරිය සහිත ඉඩම, ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව විසින් 2020 සැප්තැම්බර් 10 දින සමාගම වෙත ඔප්පුවක් මගින් නීත්‍යානුකූලව පවරාදී ඇතත් එම ඉඩම තක්සේරු කර ගිණුම්ගත නොකිරීම හේතුවෙන් මූල්‍ය ප්‍රකාශන තුළ ජංගම නොවන වත්කම් අවතක්සේරු වී තිබුණි. | අවසන් ගිණුම් ඉදිරිපත් කරන අවස්ථාවේදී මෙම ඉඩමට තක්සේරු වටිනාකමක් ගැලපීම් කර නොතිබූ අතර ඉදිරි වර්ෂයේ තක්සේරුකරුවෙකු මගින් තක්සේරු කර ගිණුම් වලට ගැලපීමට කටයුතු කරනු ලැබේ. | ඉඩමේ වටිනාකම තක්සේරු කර ගිණුම්ගත කළ යුතුය. |
| (ඉ) | සමාගම සතු රසායනාගාරය මගින් ගිණුම් වර්ෂය තුළ බාහිර ආයතන වෙත සිදුකර ඇති රසායනාගාර පරීක්ෂණ 103 කට අදාළ ආදායම රු.1,200,140 ක් වන නමුත්, මූල්‍ය ප්‍රකාශනයන්හි වර්ෂය තුළ මුදලින් ලද රු. 693,406 ක වටිනාකම පමණක් රසායනාගාර ආදායම වශයෙන් හඳුනා ගැනීම හේතුවෙන් වසරේ ලාභය රු.506,734 කින් අඩුවෙන් දක්වා තිබුණු අතර ජංගම වත්කම් එම ප්‍රමාණයෙන් අවතක්සේරු වී තිබුණි. | ඉදිරි වර්ෂයේදී ගිණුම් වලට ගැලපීමට කටයුතු කරනු ලැබේ. | සමාගම විසින් උපචිත ආදායම් නිසි පරිදි හඳුනාගෙන ගිණුම් ගත කළ යුතුය. |
| (ඊ) | ගබඩාවන් සඳහා නිසි පරිදි ගබඩා සේවකයින් සැපයීමට අපොහොසත් වීම හේතුවෙන් පෞද්ගලික ආයතනයකින් අයකරගෙන තිබුණු රු.172,500 ක ලංසු ඇපකර සමාගමේ ආදායමක් ලෙස ගිණුම් ගත නොකොට තවදුරටත් ජංගම වගකීමක් ලෙස නිරූපණය කර තිබුණි. | පෞද්ගලික ආයතනයෙන් ලබා ගෙන ඇති ලංසු ඇපකරයේ මුදල වන රු.162,500 ක මුදල මෙම ගිණුම් වර්ෂයේදී ආදායමට ගලපා නිවැරදි කරනු ලැබේ. | නිශ්චිතව අයකර ගන්නා ලද ලංසු ඇපකර සමාගමේ ආදායමක් ලෙස ගිණුම්ගත කළ යුතුය. |
| (උ) | සමාගම වෙත සේවා සපයන ලද කොන්ත්‍රාත්කරුවන් තිදෙනෙකුට අදාළව 2021 මාර්තු 31 දින වන විට මාස 06 ඉක්මවා ඇති එහෙත් ඉල්ලීම් නොලද එකතු වටිනාකම වූ රු.239,141 ක රැඳවුම් මුදල් ආදායමට ගැළපීමක් හෝ අදාළ පාර්ශවයන්ගෙන් විමසීමකින් තොරව ගෙවිය යුතු ශේෂයක් ලෙස දක්වා තිබුණි. | සමාගම වෙත සේවා සපයන ලද කොන්ත්‍රාත්කරුවන් තිදෙනෙකු වෙනුවෙන් ගෙවීමට ඇති රු.239,141 ක රැඳවුම් මුදල් සම්බන්ධව ඉදිරි ගිණුම් වර්ෂය තුළදී අවශ්‍ය ගැලපීම් කිරීමට කටයුතු කරනු ලැබේ. | ඉකුත් වූ තැන්පතු සඳහා හිමිකම් නොපාන්නේ නම් ආදායමට බැර කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඌ) | ගිණුම් වර්ෂය තුළ පාරිභෝජන ද්‍රව්‍ය ගිණුමේ ඇතුළත් ලිපි ද්‍රව්‍ය, ජලනළ උපාංග, ගොඩනැගිලි ද්‍රව්‍ය සහ වාහන අමතර කොටස් යනාදියේ රු.415,514 ක ඌනතාවය පිළිබඳ විමර්ශනයන් සිදුකර වගකිව යුත්තන්ගෙන් අයකර ගැනීම වෙනුවට ඌනතාවයේ අගය වෙනත් ලැබිය යුතු වටිනාකමක් ලෙස මූල්‍ය ප්‍රකාශන තුළ දක්වා තිබුණි. | ගිණුම් වර්ෂය තුළ පාරිභෝජ්‍ය ද්‍රව්‍ය ගබඩාවේ ඌනතාවය පිළිබඳ කරුණු පරීක්ෂා කර බැලූ අතර ඉන් රු. 2,010,196 ක වටිනාකම ගබඩාව තුළ නිකුත් නොවූ ස්ථාවර වත්කම් වශයෙන් ද රු.15,470 ක වටිනාකමින් යුතු පාරිභෝජ්‍ය අයිතම කිහිපයක් ද භෞතික තොගයට ඇතුළත් විය යුතුව තිබුණි. ඒ අනුව පාරිභෝජ්‍ය ද්‍රව්‍ය ගබඩාවේ සත්‍ය වශයෙන් ම ඌනතාවය වූයේ රු.415,514 පමණකි. | ඌනතාවය පිළිබඳ විමර්ශනයකර වගකිව යුත්තන්ගෙන් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

**1.5.2 ලැබිය යුතු මුදල්**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ලැබිය යුතු ශේෂයන් අතර පැලවත්ත සීනි සමාගමෙන් ලැබිය යුතු රු.807,650 ක ණය ශේෂයක් ඇතුළත් වන නමුත් පැලවත්ත සීනි සමාගමේ ගිණුම් තුළ එවැනි ගෙවිය යුතු අගයක් නිරූපණය නොවන අතර ලක් පොහොර සමාගම වෙත ගෙවිය යුතු සියලුම ගෙවීම් ගෙවා අවසන් කර ඇති බව පැලවත්ත සීනි සමාගම දක්වා ඇත. ඒ අනුව උක්ත ණය ශේෂය සම්බන්ධයෙන් විධිමත් විමර්ශනයක් සිදුකර ඔවුන්ගෙන් එම මුදල් අය කර ගැනීමට හෝ පොත්වලින් ලියාහැරීමට කටයුතු කර නොතිබුණි. | පැලවත්ත සිනි සමාගමෙන් ලැබිය යුතු රු.807,650 ක ණය ශේෂය ලැබිය යුතු මුදලක් සේ ගිණුම්වල ඇතුළත්ව ඇත. ඒ අනුව ඉදිරි ගිණුම් වර්ෂය තුළ මේ සම්බන්ධව විධිමත් විමර්ෂණයක් සිදු කිරීමට කටයුතු කරනු ලැබේ. | ලැබිය යුතු ශේෂයන් අයකර ගත නොහැකි නම් විධිමත් අනුමැතීන් මත පොත්වලින් කපාහළ යුතුය. |

**1.6 ගිණුම්කරණ ප්‍රතිපත්ති**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| වර්ෂ 4 සිට 11 දක්වා කාලයක් තුළ හිමිකම් නොපෑ රු.274,000 ක ආපසු ගෙවනු ලබන ලංසු ඇපකර අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය මත ආදායමට ගැනීමට කටයුතු කිරීමකින් තොරව දීර්ඝ කාලයක සිට ජංගම වගකීමක් ලෙස නිරූපණය කර තිබුණි. | වසර 4 සිට 11 කාලය තුළ ආයතනය වෙත තබා ඇති ආපසු ගෙවනු ලබන ලංසු ඇපකර වටිනාකම වන රු.274,000 ක මුදල මෙම වර්ෂයේ ආදායමට ගැලපීම් කොට නිවැරදි කරනු ලැබේ. | හිමිකම් නොපාන බව සනාථකර ගැනීමෙන් පසු ලංසු ඇපකර ආදායමට ගත යුතුය. |

## 1.7 සංවිධානයේ අඛණ්ඩ පැවැත්ම

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2021 ජුනි 08 දිනැති අංක අමප/21/0964/323/030 දරන අමාත්‍යමණ්ඩල තීරණය අනුව රජය විසින් හඳුන්වා දුන් කාබනික පොහොර ප්‍රතිපත්තිය හා 2021 ජූලි 31 දිනැති අංක 2238/45 දරන අති විශේෂ ගැසට් නිවේදනය අනුව නැවත රසායනික පොහොර ගෙන්වීම සඳහා අවසර ලබා දී ඇතත් ලක් පොහොර සමාගමට එකී අවසරය හිමි නොවීම හේතුවෙන් 2021 වර්ෂයේ සිට සමාගම මගින් සිදු කරනු ලැබූ ප්‍රධාන ව්‍යාපාරික කටයුත්ත අහිමි වී ඇත. සමාගමේ අඛණ්ඩ පැවැත්ම සහතික කළ හැකි නව ව්‍යාපාරික අවස්ථා වෙත යොමු නොවීම හේතුවෙන් සමාගමේ අඛණ්ඩ පැවැත්ම අභියෝගයට ලක්වී තිබූ බව නිරීක්ෂණය විය. | 2021 වර්ෂයේ සිට සමාගම මගින් සිදුකරනු ලබූ රසායනික පොහොර ආනයනය කිරීම සඳහා අවසරය හිමි නොවුවද රටතුළ කාබනික පොහොර ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා විශාල දායකත්වයක් ලබාදෙන ලදී. නමුත් මේ වන විට නැවත රසායනික පොහොර ආනයනය කිරීම ආරම්භ කර ඇති හෙයින් සමාගමේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ අභියෝගයක් නොමැති බව සඳහන් කරමි. | සමාගමේ අඛණ්ඩ පැවැත්ම සඳහා සුදුසු තීරණ ගත යුතුය. |

## 1.8 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| 2015 මැයි 25 දිනැති අංක PED 1/2015 චක්‍රලේඛය සහ 2016 ඔක්තෝම්බර් 25 දිනැති අංක PED 1/2015(i) දරන රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තු චක්‍රලේඛයෙහි 3 වගන්තිය. | වාහන හා ඉන්ධන දීමනාව ලබාදිය හැකි නිලධාරීන් ගණයන්ට අයත් නොවන MM 1-2 සේවා ගණයට අයත් නිලධාරීන් දසදෙනෙකු වෙත මසකට රු.10,000 බැගින් දීමනාවක් හා එම ගණයේම ප්‍රාදේශීය අලෙවිකරුවන් ලෙස කටයුතු කරන නිලධාරීන් 08 දෙනෙකු වෙත මසකට රු.40,000 ක දීමනාවක් හා උපරිම ලීටර් 125 ක ඉන්ධන දීමනාවක් ලෙස චක්‍රලේඛ විධිවිධාන අභිබවා අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය මත දීමනා ලබාදීමට කටයුතු කර තිබුණි. | මධ්‍ය මට්ටමේ කළමනාකරුවන් (MM 1-2) සඳහා කණ්ඩායම් ප්‍රවාහන පහසුකම් සැපයීමට රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ අංක 1/2015 හි අංක 04 වගන්තියෙහි ප්‍රතිපාදන ඇත. එහෙත් සමාගමේ මධ්‍ය මට්ටමේ කළමනාකරුවන් 09 දෙනෙකු සඳහා කණ්ඩායම් ප්‍රවාහන පහසුකම් සැපයීම සිදු කළ යුතු වුවද එම නිලධාරීන් එකම මාර්ගයක නොසිටීම හේතුවෙන් ඇතිවන ප්‍රායෝගික දුෂ්කරතාවයන් මෙන්ම ඒ සඳහා අවම වශයෙන් වාහන 03 ක් යෙදවීමට සිදුවේ. ඒ අනුව ආයතනය වෙත දැරීමට සිදුවන පිරිවැය සැලකිල්ලට ගෙන එක් නිලධාරියෙකුට මසකට ප්‍රවාහන දීමනාව ලෙස රු.10,000 ක මුදලක් අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය පරිදි ගෙවීම් කර ඇත.<br>රාජකාරීන් කාර්යක්ෂමව, ඵලදායීව හා තෘප්තිමත් ලෙස ඉටු කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය පරිදි ප්‍රාදේශීය අලෙවි කළමනාකරුවෙකු වෙත මසකට රු.40,000 ක දීමනාවක් හා උපරිම ලීටර් 125 ක ඉන්ධන දීමනාවක් ගෙවීම් කර ඇත. | චක්‍රලේඛ උපදෙස් ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

**1.9 තොරතුරු තාක්ෂණ (IT) පොදු පාලන ක්‍රම**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| පොහොර ලැබීම, නිකුත් කිරීම, හුවමාරු කිරීම ඇතුළු පොහොර සම්බන්ධ සම්පූර්ණ ක්‍රියාවලිය පරිගණකගත කර තිබුණු නමුත් පරිගණක පද්ධතිය වෙත පෙර දිනයක යාවත්කාලීන වන සේ දත්ත ඇතුළත් කිරීමේ හැකියාව පැවතීම, අත්‍යාවශ්‍ය පොදු පාලනයන් හා පද්ධති පාලනයක් ක්‍රියාත්මක නොවීම හේතුවෙන් පරිගණක පද්ධතිය පිළිබඳ විගණනයේදී සෑහීමට පත්විය නොහැකිව තිබුණි. | අප සමාගමේ ප්‍රාදේශිය ගබඩා 42 ක් සක්‍රීයව පවතින අතර එම ගබඩාවන්ගෙන් 29 ක් ප්‍රධාන කාර්යාලය හා සම්බන්ධ කර දත්ත යාවත්කාලීනව පද්ධතියට ඇතුළත් කිරීම් සිදු කරන අතර ඉතිරි ප්‍රාදේශීය ගබඩා සඳහා තැපැල් මාර්ගයෙන් හෝ කුරියර් මාර්ගයෙන් ලබා ගන්නා බඩු භාරගැනීමේ කුවිතාන්සි (GRN) හා ඉන්වොයිස්පත් (INVOICES) ප්‍රධාන කාර්යාලය වෙත ලද පසු පරිගණක පද්ධතියට ඇතුළත් කළ යුතු වේ. එබැවින් අපගේ පරිගණක පද්ධතිය ක්‍රියාත්මකව පවත්වාගෙන යාමේදී දත්තයන්හි තිබෙන නිවැරදිභාවය හා යාවත්කාලීනභාවය පවත්වාගෙන යාම සඳහා පාලනයකට යටත්ව පෙර දිනයන්හි යාවත්කාලීන වන සේ දත්ත ඇතුළත් කිරීමට අවස්ථාව මෙසේ ලබා දිය යුතුවේ.එසේ නොවුවහොත්විකුණුම්වාර්තා,ණයගැති/ණයහිමි කාල විශ්ලේෂණ වාර්තා,ණයගැති හා ණයහිමි පාලන ගිණුම් වාර්තා, වවුචර්පත් , තොග පාලන වාර්තා සහ අවසාන ගිණුම් වාර්තා ද පද්ධතිය මගින් ලබාගත නොහැකි වේ. | පරිගණක පද්ධති සම්බන්ධව අත්‍යවශ්‍ය පොදු පාලනයන් හා පද්ධති පාලනයන් පවත්වා ගත යුතුය. |

**2. මූල්‍ය සමාලෝචනය**

**2.1 මූල්‍ය ප්‍රතිඵලය**

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.124,392,743 ක ලාභයක් වූ අතර ඊට අනුරූපව ඉකුත් වර්ෂයේ ලාභය රු.97,993,276 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.26,399,467 ක වර්ධනයක් නිරීක්ෂණය විය. මෙම වර්ධනයට ආදායම් වැඩිවීම හා බෙදාහැරීමේ වියදම් අඩුවීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 හඳුනාගත් පාඩු**

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාගමේ අභ්‍යන්තර විගණන අංශය විසින් 2019 සැප්තැම්බර් 26 දින ඕලුමඩු ගබඩාවේ සිදු කරන ලද විමර්ෂණයකදී පොහොර ඌනතාවයක් හඳුනාගෙන ඇති අතර පොහොර ගබඩාවේ ගබඩා භාරකරු සේවයෙන් ඉවත් කොට පරීක්ෂණයන් සිදු කොට ඇත. පරීක්ෂණයන්හි ප්‍රතිඵල මත සමාගමේ සභාපති විසින් 2020 නොවැම්බර් 24 දිනැති | ඕලුමඩු ප්‍රාදේශීය පොහොර ගබඩාවේ සිදුකරන ලද විගණන පරීක්ෂණයේ දී අනාවරණය වූ රු.2,191,948.73 ක මුදල් අක්‍රමිකතාවය සම්බන්ධව අපරාධමය වරද සම්බන්ධයෙන් පියවර ගැනීම සඳහා 2020.11.24 | සාවද්‍ය ලෙස පරිහරණයකර ඇති මුදල් නැවත අයකර ගැනීමට විධිමත් හා නීත්‍යානුකූල පියවර ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| | ලිපියක් මගින් උක්ත ගබඩා භාරකරු රු.2,191,948 ක රජයේ මුදල් වංචාකර ඇති බවත් රාජ්‍ය මුදල් සාවද්‍ය පරිහරණය සම්බන්ධයෙන් විමර්ශනයක් සිදුකර ඉදිරි නීතිමය පියවර ගන්නා ලෙසත් දන්වමින් සමාගමේ සභාපති විසින් ස්ථානාධිපති විශේෂ අපරාධ විමර්ශන අංශය මුලතිව් වෙත ලිපියක් නිකුත් කර ඇත. එහෙත් උක්ත කරුණ සම්බන්ධයෙන් පොලිසිය වෙත පැමිණිල්ලක් ඉදිරිපත් කිරීමකින් තොරව අලාභ අය කර ගැනීම සඳහා සිවිල් නඩුවක් පැවරීම හේතුවෙන් රාජ්‍ය මුදල් සාවද්‍ය පරිහරණය කිරීමේ අපරාධමය වරද යටපත් කිරීමට සමාගම විසින් කටයුතු කර තිබුණි. | දිනැති පැමිණිල්ල මුලතිව් විශේෂ අපරාධ විමර්ෂණ අංශයේ ස්ථානාධිපති වෙත අප සමාගම විසින් යොමුකර ඇත. එහෙත් ඕලුමඩු ප්‍රාදේශීය පොහොර ගබඩාව පිහිටි බල ප්‍රදේශය මුලතිව් කොට්ඨාශයට නොව වවුනියාව විශේෂ අපරාධ විමර්ෂණ අංශයේ බලප්‍රදේශයට අයත් බව දැන්වීම හේතුවෙන් නැවත පැමිණිල්ලක් 2022/05/02 දිනැතිව යොමුකර ඇති අතර එම අංශයේ විමර්ෂණ කටයුතු ආරම්භ කර ඇත. එසේම ඉහත සඳහන් මුදල අයකර ගැනීම සඳහා වවුනියාව දිසා අධිකරණයේ අංක 1338/2021/M නඩුව අප සමාගම විසින් පවරා ඇත. | |
| (ආ) | පොහොර සැපයුම්කරුවන්ගේ ණයවර ලිපි කල් පිරීමේදී ණයවර ලිපි නිකුත්කර ඇති බැංකුව විසින් සමාගම වෙනුවෙන් ගෙවීම් කර ගෙවූ මුදල රුපියල් ණයකට පරිවර්තනය කිරීමේදී එදිනට අදාළව මහ බැංකුව ප්‍රකාශයට පත්කර ඇති විනිමය අනුපාතයට වඩා වැඩි අනුපාතයක් භාවිතා කිරීම හේතුවෙන් එකතු වටිනාකම රු.485,074,407 ක් කෙටිකාලීන ණය වෙනුවෙන් වැඩිපුර ගෙවීමට සමාගමට සිදුවී තිබුණි. | පොහොර ආනයනය කරනු ලැබූ සැපයුම්කරුවන්ගේ බිල්පත් කල් පිරීමේදි මහා භාණ්ඩාරයෙන් එම බිල්පත් සඳහා මුදල් නොලැබීම හේතුවෙන් බැංකුව විසින් සමාගම වෙනුවෙන් ගෙවීම් කර ගෙවූ මුදල් කෙටි කාලීන ණයකට පරිවර්තනය කරනු ලැබේ. එහිදී බැංකුව විසින් එදිනට අදාළ විනිමය අනුපාතය අප සමාගම වෙත එවනු ලබන අතර එම විනිමය අනුපාතය පදනම් කර ගනිමින් ගිණුම් තැබීම සිදු කරනු ලබයි. | මහ බැංකුව විසින් ප්‍රකාශිත විනිමය අනුපාතයන් ගැලපිය යුතුය. |

**3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා**

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ලක්පොහොර සමාගම අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය මත 2018 වර්ෂයේදී මුළු පිරිවැයෙන් සියයට 50 ක් සමාගමෙන් දායකත්වය සැපයීමේ පදනම මත අලෙවි ප්‍රවර්ධන නිලධාරීන් වෙත යතුරු පැදි ලබාදී ඇත. සමාගම හා යතුරු පැදි ලබාගත් නිලධාරීන් අතර ඇතිකරගත් ගිවිසුමට අනුව නිලධාරියා විසින් ඉතිරි සියයට 50 සමාන | සමාගමේ දායකත්වය මත 50% ක සමාන වාරික 60 කින් ගෙවීමේ පදනම මත වැඩ තහනමට ලක්වූ ඕලුමඩු ගබඩාවේ තොග නිලධාරී මහතා වෙත ලබා දුන් යතුරු පැදිය සම්බන්ධව තීරණ ගැනීම සඳහා ඔහු සම්බන්ධ විනය නියෝගය ලැබෙන්නේ 2022.08.23 දිනදීය. ඒ අනුව ඉදිරි ගිණුම් වර්ෂය තුළදී | හිඟ වාරික මුදල් අයකර ගැනීමට හෝ ගිවිසුම් ප්‍රකාරව යතුරුපැදිය නැවත සමාගම වෙත පවරා ගැනීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | වාරික 60 කින් ගෙවිය යුතු අතර ගෙවා අවසන් වන තෙක් යතුරු පැදියේ අයිතිය සමාගම සතු වේ. උක්ත වැඩසටහන යටතේ යතුරු පැදියක් ලබාගෙන ඇති එවකට ඕලුමඩු ගබඩාවේ ගබඩා භාරකරු පොහොර වංචාවක් හේතුවෙන් වැඩ තහනමකට ලක් වී ඇති අතර වැඩ තහනමට ලක්වන අවස්ථාව වන විට යතුරු පැදිය සඳහා වාරික 13 ක් පමණක් ගෙවා තිබුණි. වැඩ තහනමට ලක් වූ 2019 අගෝස්තු මස සිට සමාලෝචිත වර්ෂය අවසානය දක්වා වාරික මුදල් අයකරගැනීමට හෝ ගිවිසුම් ප්‍රකාරව යතුරුපැදිය නැවත සමාගම වෙත පවරාගැනීමට කටයුතු කර නොතිබීම හේතුවෙන් රු.325,000ක් වටිනා රජයේ දේපළක් අවභාවිතා වී ඇති බව නිරීක්ෂණය විය. | එම යතුරු පැදිය ලබා ගැනීමට අදාළ ක්‍රියාමාර්ග ගෙන ඇත. | |
| (ආ) | සමාගම සතු නුවරඑළිය හා පොළොන්නරුව සංචාරක බංගලා සඳහා අයකරනු ලබන ගාස්තු 2019 මැයි 10 දින අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය මත සංශෝධනය කර ඇත. සංශෝධිත ගාස්තු ඇතුළත් අභ්‍යන්තර කාර්යාල සටහන් පත්‍රය අනුව උත්සව සමය හා උත්සව නොවන සමය ලෙස ගාස්තු වර්ග 2 ක් හා සමාගමේ සේවකයන් හා භාහිර පුද්ගලයින් සඳහා වෙනස් ගාස්තු අයකිරීමේ අවස්ථා 2 ක් හඳුන්වා දී තිබූ නමුත්, උත්සව සමය හා උත්සව නොවන සමයට ඇතුළත් වන කාලය නිවැරදිව හඳුන්වා දී නොතිබුණි. අභ්‍යන්තර කාර්යාල සටහන් පත්‍ර දිනයේ සිට සංශෝධිත ගාස්තු අයකළ යුතු වුවත් සමාගමේ විධායක නිලධාරීන්ගේ මැදිහත් වීම මත අනුමත උක්ත ගාස්තු නිවැරදිව අය කිරීමකින් තොරව අඩු ගාස්තු අයකරමින් අභ්‍යන්තර හා බාහිර පාර්ශවයන් වෙත සංචාරක බංගලාව භාවිතා කිරීමට අවස්ථාව ලබා දී තිබුණි. | අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද මිල ගණන් වලට වෙනස් මිල ගණන් යටතේ හෝ නොමිලේ නිවාඩු නිකේතන වෙන් කිරීමට කටයුතු කර ඇති බව 2020 සැප්තැම්බර් මස වන විට අප විසින් හඳුනා ගන්නා ලදී. එම හඳුනා ගැනීමෙන් අනතුරුව නිවාඩු නිකේතන භාරකරුට අවශ්‍ය උපදෙස් ලබා දී ඇත. උත්සව සමය "අප්‍රේල් මාසය" වශයෙන් කාලසීමාවක් හඳුන්වාදීම අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකාවේ හා නිකුත් කරන ලද අභ්‍යන්තර කාර්යාල සටහන් පත්‍රයේ දක්වා ඇත. අප්‍රේල් මාසය හැර අනෙකුත් කාලසීමාවන් උත්සව නොවන කාල සීමාව සේ සලකා මිල ගණන් අයකරනු ඇත. | අනුමත ගාස්තු නිවැරදිව අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) | කොවිඩ් 19 වසංගත තත්ත්වය හේතුවෙන් රට වසා තැබීම නිසා මුර ක්‍රමයට රාජකාරී කිරීම් හඳුන්වා දී ඇතත් එම ක්‍රමය ක්‍රියාත්මක නොවීම හා අතිකාල පාලනය නොකිරීම හේතුවෙන් පසුගිය වර්ෂයට සාපේක්ෂව සියයට 12.3 ක වැඩිවීමක් ද | කොවිඩ් වසංගතය තත්වය හේතුවෙන් රට වසා තැබීමක් සිදුකල ද මුර ක්‍රමයට රාජකාරී කිරීම හඳුන්වා දුන්නද සීමාසහිත ලංකා පොහොර සමාගම යල හා මහ කන්නයන් වෙනුවෙන් නිසි කලට නිසි වේලාවට පොහොර බෙදාහැරීමේ කටයුතු | දීමනා ගෙවීමේදී නිසි පාලනයන් අනුගමනය කළ යුතුය. |

| | | |
|---|---|---|
| සහිතව රු.39,219,757 අතිකාල දීමනා ගෙවා තිබුණි. | සිදු කරන ලදී. ඒ අනුව බෙදාහැරීම් අංශය තුළ දිවා රාත්‍රී නොබලා එම රාජකාරී කටයුතු සිදු කරන ලද අතර එහිදී මුර ක්‍රමයට රාජකාරී කටයුතු සිදු කිරීමක් නොකෙරුනි. එබැවින් මෙම අතිකාල දීමනා වැඩිවීම සාමාන්‍ය පරිදි සිදු වූවක් බව සඳහන් කරමි. | |

**3.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| පොහොර ප්‍රවාහනය සඳහා ප්‍රවාහන ආයතන සමඟ ඇති කර ගෙන ඇති ගිවිසුම ප්‍රකාරව ප්‍රවාහනය සඳහා භාර දුන් තොගයන්ට හානි සිදුවුවහොත් අදාළ හානිවූ තොගයේ පිරිවැය ප්‍රවාහන ආයතනය විසින් සමාගමට ගෙවිය යුතු වේ. එහෙත් සහනාධාර MOP පොහොර රැගත් ලොරි රථයක් 2020 දෙසැම්බර් 21 දින ගම්පහ ඉඹුල්ගොඩ ප්‍රදේශයේදී හදිසි අනතුරට පත්වීමෙන් පළුදු වූ හා වැලි මිශ්‍ර වූ පොහොර මිටි 58 ක් නැවත පොහොර සමාගම වෙත භාරගෙන පොහොර මිටි 50 ලෙස සකසා තොගයට ගෙන ඇතත් ඒ සම්බන්ධව විධිමත් පරීක්ෂණයක් සිදුකර එම සමාගමෙන් මුදල් අයකර ගැනීමටත් ගබඩාවේ රඳවා තිබෙන එම පොහොර තොගය භාවිතයට ගැනීමටත් කටයුතුකර නොතිබුණි. | හම්ඩ් ප්‍රවාහන සේවයට අයත් ලොරි රථයකින් හුණුපිටියේ සිට ප්‍රාදේශීය ගබඩාවක් වෙත MOP පොහොර තොගයක් ප්‍රවාහනය කරමින් තිබියදී ගම්පහ ඉඹුලගොඩ ප්‍රදේශයේදී හදිසි අනතුරකට පත්වීමෙන් පලුදු වී හා වැලි මිශ්‍රව පැවති MOP මිටි 58ක් නැවත මළු කර හානියට පත් වූ තොගය වෙනුවෙන් රු.302,533.65 ක මුදලක් වෙනම චෙක්පතක් මගින් අප සමාගම වෙත ගෙවා ඇති අතර හානියට පත් වූ සම්පූර්ණ තොගය සමාගම භාරයට ගෙන අංක 07 ගබඩාවේ ගබඩා කර ඇත. තවද ප්‍රවාහනකරු වෙතින් එම අලාභය අයකර ගත් පසු එම හානියට පත් වූ පොහොර තොගය ප්‍රවාහනකරු විසින් ලබා දෙන ලෙස ඉල්ලුම්කළ නමුත් එය සමාගම සතු පොහොර තොගයක් බැවින් එම පොහොර තොගය සමාගම සන්තකයට ගෙන අදාළ පොහොර තොගය වෙනුවෙන් ඉහත අලාභය අයකර ගැනීමට කටයුතු කර ඇත. | විධිමත් පරීක්ෂණයක් සිදුකර අලාභ අයකර ගැනීමටත් ඉතිරි තොගය භාවිතයට ගැනීමටත් කටයුතු කළ යුතුය. |

**3.4 නිෂ්කාර්ය හෝ ඌන උපයෝජිත දේපල, පිරියත හා උපකරණ**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාගම සතුව ශ්‍රී ලංකා අනුකූලතාවය අගය කිරීම් පැවරීමේ මණ්ඩලයේ (Sri Lanka Accreditation Board) හි ලියාපදිංචිය ලත් රු.19,264,125 ක වටිනා රසායනාගාර උපකරණ සහිත රසායනාගාරයක් පැවතියද, සමාලෝචිත වර්ෂය තුළ සිදු කර තිබූ නියැදි පරීක්ෂණ | හරිත කෘෂිකර්මාන්තයක් සඳහා රාජ්‍ය ප්‍රතිපත්තීන් ක්‍රියාත්මක කිරීමේදී මේ වන විට අප සමාගමේ රසායනාගාරයට අසීමිත වගකීමක් පැවරී ඇත. ඒ අනුව ආයතනය මිලදී ගන්නා පොහොර සාම්පල් පරාමිතියන් 836ක් සිදු කර ඇති අතර එහි වටිනාකම ගිණුම් වලට ගැලපීම් කළ | සමාගම සතු සම්පත් වලින් උපරිම ආදායමක් ඉපයීමට හැකි වන පරිදි උපාය මාර්ග සැලැස්මක් සකස් කර ක්‍රියාත්මක කළ යුතුය. |

| | | |
|---|---|---|
| සංඛ්‍යාව 103 ක් වන අතර ඊට අදාළ ආදායම රු.1,200,140 කි. මෙම රසායනාගාරයෙන් ආදායමක් ඉපයීමට හැකි වන පරිදි උපාය මාර්ග සැලැස්මක් සකස් කර ක්‍රියාත්මක කිරීමට කටයුතු කර නොතිබුණු අතරම මෙම නිසා රසායනාගාරය සතු සම්පත් ඌන උපයෝජිතව පැවතුන බව නිරීක්ෂණ විය. | නොහැක. එම නිසා සංඛ්‍යාත්මකව ගිණුම්ගත නොවූ අගය රු.1,919,900 කි. භාහිර ආයතන මගින් සිදු කරන පරීක්ෂාවන් වලින් පමණක් ලැබෙන ආදායම ගිණුම්ගත කොට ඇත. එහි සංඛ්‍යාත්මක වටිනාකම රු.693,406 කි. රසායනාගාරය තුළ සේවකයින් තුන්දෙනෙකු පමණක් රාජකාරී කටයුතු සිදු කරනු ලබන අතර එම සේවකයින්ගෙන් උපරිම කාර්යක්ෂමතාවයෙන් හා ඵලදායිත්වයෙන් රාජකාරී කටයුතු සිදු කර ඇත. මෙම විශ්ලේෂණයන් සඳහා රසායනාගාර උපකරණ උපරිම ලෙස භාවිතයෙහි යොදවා ඇති අතර ඉන් සමහර උපකරණ කිහිප වරක් අළුත්වැඩියාකර භාවිතයෙන් ඉවත් කිරීමට සිදුව ඇත. | |

## 3.5 මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සහනාධාර පොහොර ලබාදීමේ ක්‍රමය ක්‍රියාත්මක වූ 2006 වර්ෂයේ සිට වී වගාව සඳහා පොහොර නිකුත් කිරීමේ රජයේ නියෝජිතයා ලෙස ලක් පොහොර සමාගම කටයුතු කරනු ලබන අතර එදින සිට අලෙවි ප්‍රවර්ධනය හා අලෙවි සම්බන්ධ වෙනත් කාර්යයන් විශාල ලෙස අඩුවී ඇත. ඒ අනුව අනුමත සේවක සංඛ්‍යාව සංශෝධනය කිරීම වෙනුවට සමාගම අනුමත අලෙවිකරණ කාර්යය මණ්ඩලයට අයත්, දිස්ත්‍රික්ක අලෙවි ප්‍රවර්ධකයන්, ප්‍රාදේශීය අලෙවි ප්‍රවර්ධකයන්, අලෙවි ප්‍රවර්ධන නිලධාරීන් යන තනතුරුවල දිගින් දිගටම පුරප්පාඩු පිරවීමට කටයුතු කර ඇති අතර 2021 වර්ෂයේදී ප්‍රාදේශීය අලෙවි කළමනාකරු තනතුරු 5 ක් සඳහා වැඩ බැලීමේ පදනම මත බඳවා ගැනීම් සිදුකර තිබුණි . මේ හේතුවෙන් සමාගමට වැටුප් හා දීමනා සඳහා අනාර්ථික පිරිවැයක් දැරීමට සිදු වී තිබුණි. | කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් 2011.08.25 දිනැතිව අප සමාගම වෙත අනුමත කරන ලද කාර්ය මණ්ඩල සංයුතියෙහි මධ්‍ය මට්ටමේ කළමනාකාර සේවා ගණයේ ප්‍රාදේශීය අලෙවි කළමනාකරු තනතුරු 09 ක් ඇතුළත්ව ඇත. කෘෂිකර්මාන්තය මුළුමනින්ම කාබනික පොහොර භාවිතයට යොමු කිරීමේ එවකට පැවති රාජ්‍ය ප්‍රතිපත්තියට අනුව, කාබනික පොහොර සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීම හා කාබනික පොහොර මිලදී ගැනීමේ/ බෙදාහැරීමේ කටයුතු සම්බන්ධීකරණය මෙන්ම අපගේ ගබඩා ජාලය මෙහෙයවීම හා ක්‍රියාත්මක කිරීම ප්‍රාදේශීය අලෙවි කළමනාකරුවන් වෙත පවරා තිබූ බැවින්, පුරප්පාඩුව පැවති ප්‍රාදේශීය අලෙවි කළමනාකරු තනතුරු 05 ක් සඳහා වැඩ බැලීමේ පදනම මත පත්කර ඇත. | කාර්යභාරයන් නැවත සමාලෝචනය කර ඒ අනුව අනුමත සේවක සංඛ්‍යාව සංශෝධනය කළ යුතුය. |

## 4. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය

### 4.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2003 ජූනි 02 දිනැති අංක PED/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයෙහි 6.5.1 වගන්තිය ප්‍රකාරව, ගිණුම් වර්ෂය අවසන්වී දින 60 ක් ඇතුළත සෑම රාජ්‍ය සමාගමක්ම මූල්‍ය ප්‍රකාශන සකස්කොට විගණකාධිපති වෙත ඉදිරිපත්කළ යුතු වුවත්, 2020/2021 මූල්‍ය වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන ගිණුම් වර්ෂය අවසන්වී දින 229 ක් ගතවීමෙන් පසුව විගණකාධිපති වෙත ඉදිරිපත් කර තිබුණි. | රට තුළ පැවති අයහපත් සෞඛ්‍ය තත්වය හා රාජකාරීයට සේවකයින් කැඳවීම සීමා කිරීම හේතුවෙන් නියමිත දිනට අවසන් ගිණුම් වාර්තා ඉදිරිපත් කිරීමට නොහැකි විය. | චක්‍රලේඛ උපදෙස් පරිදි කටයුතු කළ යුතුය. |